**09-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරමාත්ම පියා පැමිණියේ ඔබට අසීමිත දේපළ දීමටයි. එවන් බොහෝ මිහිරි පියාව, සෙනෙහසින් යුතුව සිහිපත් කරන්න, එවිට ඔබ පාරිශුද්ධ වෙයි.

**ප්‍රශ්නය:** විනාශ කාලය ලං වත්ම, කුමන සලකුණු තිබෙයිද?

**පිළිතුර:** විනාශ කාලය ලංවත්ම සෑම කෙනෙක්ම මෙය දැනගනීවි 1. අපගේ බාබා පැමිණ සිටියි. 2. නව ලෝකය දැන් ස්ථාපිත වන බව, සහ පැරණි ලෝකය විනාශ වීමට යන බව. බොහෝ දෙනෙකුට දර්ශන ඇතිවෙයි. 3. සන්‍යාසීන්, රජවරුන් යන සියල්ලන්ටම ඥානය ලැබෙයි. 4. අසීමිත පියා පැමිණ ඇති බව, සහ විමුක්තිය පිරිනැමිය හැක්කේ ඔහුට පමණක් බව, මිනිසුන්ට අසන්නට ලැබෙන විට, බොහෝ දෙනෙක් පැමිණෙයි. 5. බොහෝ දෙනෙකුට පුවත්පත් මගින් මෙම පණිවුඩය ලැබෙයි. 6. ඔය දරුවන් දිගින් දිගටම ජීවාත්ම අවධානයට පත් වෙයි. ඔබ එක් පරම පියාගේ සිහි කිරීම තුළින් අතීන්ද්‍රිය සතුටින් සිටීවි.

**ගීතය:** මෙම පාපකාරී පැරණි ලොවින් අපව ඉවත්කර, සුව පහසුව ඇති ලොවකට රැගෙන යන්න.

ඕම් ශාන්ති. මෙසේ පවසන්නේ කවුරුන්ද, එමෙන්ම ඔහු මෙසේ පවසන්නේ කා හටද? ආධ්‍යාත්මික දරුවන්ට. බාබා නැවත නැවතත් 'ආධ්‍යාත්මික' කියා පවසන්නේ ඇයි? ඔය ජීවාත්ම දැන් ආපසු නිවසට යා යුතු බැවින්. ඉන්පසුව ඔබ මෙම ලෝකයට පැමිණෙන විට, සතුට තිබෙයි. පෙර චක්‍රයේද ඔය ජීවයන්ට ඔබගේ සාමයේ සහ සතුටේ උරුමය හිමි විය. එම උරුමය දැන් නැවත වරක් ලැබෙනවා. මෙය නැවත සිදුවන විට පමණයි, ලෝක චක්‍රයට නැවත වතාවක් සිදුවිය හැකි වන්නේ. සෑම දෙයක්ම නැවත සිදුවනවා, එහෙම නේද? අතීතයේ සිදු වූ සෑම දෙයක්ම නැවත සිදුවෙයි. ඇත්ත වශයෙන්ම නාට්‍යයක් වුවද නැවත සිදුවන නමුත් එහි වෙනස්කම් තිබිය හැක ඔවුන්ට වචන අමතක වන්නේ නම්, ඔවුන්ට යමක් ඒ මොහොතේ සිතා, එම වචන කිව හැක. කෙසේවෙතත්, මෙයට, කිසිදු වෙනසක් සිදු කළ නොහැකි චිත්‍රපටියක් යැයි කියයි. මෙම නාටකය සදාතනිකවම පෙර නියම වූවක්. එම නාටකයට පෙර නියම වූවක් කියා කිව නොහැක. මෙම නාටකය වටහා ගැනීමෙන්, ඔබට එම නාටකයද වටහා ගැනීමට හැකි වෙයි. ඔබ දැන් දකින සෑම නාටකයක්ම බොරුවක් බව, ඔය දරුවන්ට දැන් වැටහෙයි. කලි යුගයේ ඔබ දකින කිසිම දෙයක්, ස්වර්ණමය යුගයේ නොපවතී. ස්වර්ණමය යුගයේ සිදු වූ සෑම දෙයක්ම නැවත සිදුවන්නේ ස්වර්ණමය යුගයේදී පමණයි. එම සීමිත නාටක, භක්ති මාර්ගයේදී පවතී. භක්ති මාර්ගයේදී පවතින දේවල්, ඥාන මාවතේ හෝ ස්වර්ණමය යුගයේදී නොපවතී. ඉතිං, ඔබට දැන් අසීමිත පියාගෙන් ඔබගේ උරුමය හිමි වනවා. ඔබට එක් උරුමයක් ඔබගේ ලෞකික පියවරුන් ගෙන් ලැබෙන බවත්, අනෙක් උරුමය ඔබගේ පාරලෞකික පියාගෙන් හිමි වන නමුත්, ඔබට අලෞකික පියාගෙන් කිසිම උරුමයක් නොලැබෙන බවත් බාබා විස්තර කර ඇත. ඔහුටත් උරුමයක් හිමිවන්නේ එම ඒකායන කෙනාගෙනි. අසීමිත පියා ඔබට නව ලෝකයේ දේපළ ලබා දෙන්නේ මෙම කෙනාගේ මාර්ගයෙන් පමණයි. ඔහු එම කෙනාගේ මාර්ගයෙන් ඔබව දරුකමට හදාගනී, ඔහුටත් පියෙක් යැයි කියන්නේ එම නිසාය. භක්ති මාර්ගයේ ඔවුන්ගේ ලෞකික පියවරුන් සහ පාරලෞකික පියාව ඔවුන් සිහිපත් කරයි. ඔහුගෙන් උරුමයක් නොලැබෙන නිසා, මෙම අලෞකික පියාව සිහි නොකරයි. 'පියා' යන වචනය නිවැරදි නමුත් බ්‍රහ්මද නිර්මාණයේ කොටසකි. නිර්මාපකයාගෙන්, නිර්මාණයට උරුමයක් හිමි වෙයි. ඔබව නිර්මාණය කළේ ශිව බාබාය. ඔහු බ්‍රහ්මවත් නිර්මාණය කළා. උරුමයක් හිමිවන්නේ, නිර්මාණකරුගෙනි, අසීමිත පියා වන ඒකායන කෙනාගෙන්. බ්‍රහ්මට අසීමිත උරුමයක් තිබෙනවාද? පරමාත්ම පියා මෙතැන අසුන්ගෙන මෙම කෙනාගේ මාර්ගයෙන් පහදා දෙන්නේ, ඔහුටද උරුමයක් හිමි වන බවයි. ඔහු, ඔහුගේ උරුමය හිමි කරගෙන, ඉන්පසුව එය ඔබට දෙනවා නොවෙයි. පරම පියා පවසන්නේ ඔබ මෙම කෙනාව සිහිපත් නොකළ යුතුයි. ඔබට මෙම දේපළ හිමිවන්නේ අසීමිත පියාගෙනි. ඔබට ඔබගේ සීමිත පියාගෙන් සීමිත උරුමයක්ද පාරලෞකික පියාගෙන් අසීමිත උරුමයක්ද හිමිවෙයි මේ දෙකම ඔබ වෙනුවෙන් වෙන් කර ඇත. ඔබට ශිව බාබාගෙන් උරුමයක් හිමි වන බව ඔබගේ බුද්ධියට ඇතුළු වන නමුත්, ඔබට බ්‍රහ්මගෙන් කුමන උරුමයක් ලැබෙනවා කියාද ඔබ පවසන්නේ? දේපළ ඔබගේ බුද්ධියට ඇතුළු වනවා නොවේද? ඔබට මෙම අසීමිත ආධිපත්‍යය එම කෙනාගෙන් හිමිවෙයි. ඔහු ශ්‍රේෂ්ඨතම බාබාය. මෙම කෙනා පවසන්නේ මා සිහිපත් නොකරන්න! ඔබට ලබා ගත හැකි කිසිම දේපළක් මට නැත. ඔබට දේපළ හිමිකර දීමට යන කෙනාව සිහි

කරන්න. ඔහු පවසන්නේ නිරතුරුවම මා පමණක් සිහි කරන්න! භෞතික පියෙකුගේ දේපළ වෙනුවෙන් බොහෝ කොලාහල ඇතිවෙයි. මෙහි කෝලාහල ඇති කිරීම ගැන ප්‍රශ්නයක් නැත. ඔබ පරමාත්ම පියා සිහි නොකරන්නේ නම්, ඔබට ඉබේටම අසීමිත උරුමයක් හිමි නොවෙයි. පියා පවසන්නේ තමන් ජීවාත්ම බව සලකන්න. ඔහු මෙම රථයටත් පවසන්නේ තමන් ජීවාත්මයක් බව සලකා, මා සිහිපත් කරන්න, එවිට ඔබට ලෝක ආධිපත්‍යය හිමි වෙයි. මෙයට සිහිපත් කිරීමේ වන්දනා ගමන යැයි කියයි. ඔබගේ සියලුම ශාරීරික නෑදෑයින් අතහැර, තමන් අශාරීරික ජීවාත්මයක් බව සලකන්න. මේ සඳහා උත්සාහයක් අවශ්‍යයි. ඉගෙනගැනීමට යම් උත්සාහයක් දැරීමට සිදුවෙයි. මෙම සිහිපත් කිරීමේ වන්දනා ගමන තුළින්, ඔබ අපවිත්‍ර බවින් පිවිතුරු වෙයි. ඒ මිනිසුන් භෞතික ලෙස වන්දනා ගමන් වල යයි. මෙහි, මෙය ජීවයේ වන්දනා ගමනයි. මෙය ඔබ උත්තරීතර දේශයට යන ඔබගේ වන්දනා ගමනයි. මෙම උත්සාහය නොදරා, කිසිම කෙනෙකුට උත්තරීතර දේශයට සහ ඉන්සුව විමුක්ති දේශයට යා නොහැක. ඉතා හොඳින් සිහිපත් කිරීමේ සිටින අයට පමණයි එහි යාමට හැකි වන්නේ. උසස් තත්ත්වයක් හිමි කරගන්නේ ඔවුන්ය. සෑම කෙනෙක්ම ආපසු යන නමුත් ඔවුන් අපවිත්‍ර බැවින් ඔවුන් දිගටම කන්නලව් කරති. ජීවාත්මය, සිහිපත් කරයි. කෑම කන්නේ සහ බොන්නේ ජීවාත්මයයි. ජීවාත්ම අවධානයට පත් වන්න! මෙකල ඔබ කළ යුතු එකම උත්සාහය මෙය පමණයි. උත්සාහ නොදරා, ඔබට කිසි දෙයක් ලැබෙන්නේ නැත. එය ඉතාමත්ම පහසු නමුත් දිගින් දිගටම මායාගෙන් එදිරිවාදිකම් සිදුවෙයි. කෙනෙකුගේ භාග්‍යය හොඳ වන විට, ඔහු විගසින් මේ දේහි නියැලෙයි. සමහරුන් පසුවත් පැමිණෙයි. එය ඔවුන්ගේ බුද්ධියේ හොඳින් තැන්පත් වන විට ඔවුන් කියන්නේ අපි දැන් මෙම ආධ්‍යාත්මික වන්දනාවේ අපව කාර්යබහුල කරවීමට යනවා. ඔවුන් තීව්‍ර ලෙස තමන්ව මෙහි කාර්යබහුල කරන්නේ නම්, ඔවුන්ට ඉතා හොඳින් තරඟයේ ඉදිරියෙන් දිව යාමට හැකි වෙයි. ඔවුන්ගේ නිවෙස් වල තම පවුලේ අය සමඟ වාසය කරන අතර වුවද, තමන් ජීවාත්මයක් බව සලකා පාරිශුද්ධකරු පරමාත්ම පියාව සිහිපත් කිරීම, ඉතා හොඳ මෙන්ම කළ යුතු නිවැරදි දේ බව, ඔවුන්ගේ බුද්ධියට ඇතුළු වෙයි. ඔබ පරම පියාගේ අණසක අනුගමනය කරන විට, ඔබට පිවිතුරු විය හැක ඔබ අනිවාර්යයෙන්ම එය බවට පත් වෙයි. එය උත්සාහ දැරීම පිළිබඳ කාරණාවකි. එය ඉතාමත්ම පහසුයි. භක්ති මාර්ගයේ බොහෝ අපහසුතා තිබේ. මෙහි, ඔබ බාබා වෙතට ආපසු යා යුතු බව, ඔබගේ බුද්ධිය තුළ තිබේ. ඉන්පසුව ඔබ එහි ගොස් (ස්වර්ණමය යුගය) විෂ්ණුගේ මාලාවේ ඇමිණෙයි. සියලුම මාලාවන් ගැන ටිකක් සිතන්න! බ්‍රහ්මගේ මාලාව, විෂ්ණුගේ මාලාව සහ රුද්‍රාගේ මාලාව තිබේ. නව ලෝකයේ පළමුවන කෙනා මෙම කෙනාය. අන් සෑම කෙනෙක්ම පැමිණෙන්නේ පසුවයි, එනම්, ඔවුන් ඇමිණෙන්නේ පසුවයි. ඔවුන් විමසන්නේ ඔබගේ උසස්ම වංශය කුමක්ද? ඔබට මෙසේ පිළිතුරු දිය හැක විෂ්ණුගේ වංශය. මුලින්ම ඔබ විෂ්ණුගේ වංශයට අයත් වූ අතර, ඉන්පසුව ඔබ ක්ෂත්‍රීය වංශයේ කොටසක් බවට පත් විය. ඉන්පසුව පෙළපත් වෘක්ෂ ඉන් මතු විය. පෙළපත් වෘක්ෂ නිර්මාණය වන්නේ කෙසේද කියා ඔබට මෙම ඥානය තුළින් වටහා ගත හැක. පළමුවෙන්ම රුද්‍රාගේ මාලාව නිර්මාණය කෙරෙනවා. උසස්ම පෙළපත් වෘක්ෂය මෙයයි. මෙය ඔබගේ වැඩියෙන්ම උසස් වංශය බව, බාබා විස්තර කර ඇත. මුළු ලෝකයටම අනිවාර්යයෙන්ම පණිවුඩය ලැබෙන බවත් ඔබට වැටහෙනවා. සමහරු පවසන්නේ දෙවියන් නිසැකයෙන්ම කොහේ හෝ ස්ථානයකට පැමිණ සිටිනවා, නමුත් කොතැනද කියා අපට කිව නොහැක. සෑම කෙනෙක්ම යථා කාලයේදී දැන ගනිවි. එය දිගින් දිගටම පුවත්පත් වල පළවෙයි. වර්තමානයේ ඔවුන් පළ කරන්නේ ටිකකි. සෑම කෙනෙක්ම එකම පුවත්පත් නොකියවයි. ඔව්, ඒවා පුස්තකාලවලදී කියවිය හැක. ඇතැම් අය විවිධ පුවත් පත් දෙකක් හෝ හතරක් පවා කියවයි. සමහරුන් කිසිම පුවත්පතක් නොකියවයි. බාබා පැමිණ ඇති බව සෑම කෙනෙක්ම දැනගත යුතුයි. විනාශ කාලය ලංවත්ම, නව ලෝකය ස්ථාපනය වන බවත්, පැරණි ලෝකය විනාශ වීමට යන බවත් ඔවුන්ට දැනගන්නට ලැබෙයි. බොහෝ දෙනෙකුට දර්ශන ලැබෙන්නට පුළුවනි. ඔබ මෙම ඥානය සන්‍යාසීන්ට සහ රජවරුන්ටද ලබා දිය යුතුයි. බොහෝ දෙනෙකුට මෙම පණිවිඩය ලැබීමට තිබෙයි. අසීමිත පියා පැමිණ ඇති බවත්, ඔහු විමුක්තිය ලබා දෙන බවත් ඔවුන්ට අසන්නට ලැබෙන විට, බොහෝ දෙනෙක් පැමිණෙයි. වර්තමානයේ ඔබ කැමති කිසිම දෙයක් පුවත්පත් වල නිල වශයෙන් පළවී නැත. මේ ගැන විමසන කෙනෙක් මතුවෙයි. ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් ඔබ ස්වර්ණමය යුගය ස්ථාපිත කරන බව, ඔය දරුවන්ට වැටහෙයි. ඔබගේ නව දූත මෙහෙය මෙයයි. ක්‍රිස්තියානුවන්, ක්‍රිස්තියානි දූත මෙහෙයක සාමාජිකයන් වන අන්දමින්ම, ඔබ පරමාත්ම දෙවියන්ගේ දූත මෙහෙයේ දෙවියන්ගේ සාමාජිකයන්ය. ඔබ පරමාත්ම දෙවියන්ගේ සාමාජිකයන්ය. ඔබට අතීන්ද්‍රීය සතුට ගැන දැනගැනීමට අවශ්‍ය නම්, ජීවාත්ම අවධානයට පත්වූ ගොපළු ගොපලියන්ගෙන් ඔබ විමසිය යුතු බව, සිහිකර තිබෙන්නේ මේ නිසාය. ඒකායන පියා හැර වෙනත් කිසිවෙක් සිහි නොකරන්න. මෙම රාජයෝගාව උගන්වන්නේ ඒකායන පියා පමණයි. ගීතාවේ දෙවියන් ඔහුයි. සෑම කෙනෙකුටම මෙම

පණිවුඩය හෝ පියාගේ ආරාධනාව ලබා දිය යුතුයි. අන් සෑම දෙයක්ම දැනුමේ සැරසිලියි. සියලුම පිංතූර, භක්තියේ නොව, ඥානයේ සැරසිලිය. පරමාත්ම පියා ඒවා සාදවා ඇත්තේ මිනිසුන්ට විස්තර කර දීම සඳහාය. මෙම සියලුම පිංතූර අතුරුදහන් වී, ජීවාත්මය තුළ, ඥානය පමණක් ඉතිරි වෙයි. පරම පියාට මෙම ඥානය තිබෙන අතර, එය නාටකයේද පටිගත වී තිබේ. ඔබ දැන් භක්ති මාර්ගය පසුකරමින්, ඥාන මාවතට පැමිණ ඇත. ඔබ තුළ තිබෙන චරිත කොටස් ඔබ රඟපාන බව, ඔය ජීවාත්මයන්ට දැන් වැටහෙයි. අපට පියා සමඟ නැවත වතාවක් රාජයෝගාව ඉගෙනගැනීමට පටිගත වී තිබේ. අපට මෙම ඥානය ලබා දීමට පැමිණෙන්නේ පරම පියා පමණයි. එය ජීවාත්මය තුළ පටිගත වී තිබේ. ඔබ එහි ලඟා වූ විට, නව ලෝකයේ චරිත කොටස නැවතත් සිදුවෙයි. මුල සිට අවසානය දක්වා, ජීවාත්මයේ මුළු පටිගත කිරීම (රෙකෝඩ්) ඔබට දැන් වැටහෙයි. ඉන්පසු මේ සෑම දෙයක්ම අවසන් වෙයි. භක්ති මාර්ගයේ කොටසද අවසන් වෙයි. ඉන්පසුව ඔබ ස්වර්ණමය යුගයේ රඟ දැක්වූ කුමන හෝ රංගනයක් තිබේද, ඔබ නැවත වතාවක් එය රඟපානු ඇත. සිදු වීමට යන්නේ කුමක්ද කියා පරමාත්ම පියා ඔබට නොකියයි. සිදු වූ කුමන හෝ දෙයක් තිබේද, එය නැවතත් සිදුවෙයි. ස්වර්ණමය යුගය, නව ලෝකය බව ඔබට වැටහෙයි. එහි සෑම දෙයක්ම අනිවාර්යෙන්ම අළුත් මෙන්ම සතෝප්‍රධාන් වෙයි. සෑම දෙයක්ම බොහෝ ලාබ වෙයි. පෙර චක්‍රයේ කුමක් සිදු වූයේද, එය නැවතත් සිදුවෙයි. ලක්ෂ්මී සහ නාරායනට කෙතරම් සතුට තිබුණේද කියා ඔබට දැකගත හැක. ඔවුන්ට බොහෝ දියමන්ති සහ මැණික්, බොහෝ ධනය ආදිය තිබුණි. ඔබට ධනය තිබෙන විට, ඔබට සතුටද තිබෙයි. ඔබට එය, මෙහෙ සමඟ සැසඳිය හැක, නමුත් එහිදී සැසඳිය නොහැක මෙහි තිබුණු සෑම දෙයක්ම එහිදී අමතක වී ඇත. මෙම දේවල්, පරම පියා පමණක් දරුවන්ට විස්තර කර දෙන, අළුත් කරුණුය. සියලුම ක්‍රියා නතර වන, එහෙට (ජීව ලෝකයට) ජීවාත්ම පළමුවෙන්ම යා යුතුයි. සියලුම කර්ම ගිණුම් පියවෙනවා. තැටිය (රෙකෝඩ්) අවසන් වනවා. මෙම එක් තැටිය, ඉතා දීර්ඝයි. ඔවුන් පවසන්නේ එසේනම්, ජීවාත්මද එතරම්ම විශාල විය යුතුයි. කෙසේනමුත්, නැහැ! මෙතරම් කුඩා ජීවාත්මයක, උපත් 84 ක චරිත කොටස් ඔහු තුළ පටිගත වී තිබේ. ජීවාත්ම අවිනාශීය. මෙයට කිව හැක්කේ ස්වභාව ධර්මයේ විශ්මයක් කියා පමණයි. මෙතරම් විශ්මිත දෙයක් තවත් තිබිය නොහැක. බාබා ගැන කියැවෙන්නේ, ඔහු ස්වර්ණමය සහ රිදී යුගයන්හිදි විවේකිව සිටින නමුත් ඔබ පූර්ණ චක්‍රය වටා සම්පූර්ණ චරිත කොටස් රඟපාන බවයි. දීර්ඝතම කොටස් තිබෙන්නේ ඔබටයි. එබැවින් පරමාත්ම පියා ඔබට උසස් උරුමයක් ලබා දෙයි. ඔහු පවසන්නේ ඔබ උපත් 84ක් ගනී. මගේ කොටස කෙබඳුද යත්, වෙනත් කිසිවෙකුට එය රඟපෑ නොහැක. මෙය ආශ්චර්යමත් දෙයකි. පරමාත්ම පියා මෙතැන අසුන්ගෙන ජීවාත්මයන්ට විස්තර කර දෙන අන්දම, විශ්මයකි. ජීවාත්ම, ස්ත්‍රී හෝ පුරුෂ නොවේ. ඔහුට හෝ ඇයට ස්ත්‍රී හෝ පුරුෂ යැයි කියන්නේ, ජීවාත්මයක් ශරීරයක් ගත් විටයි. සියලුම ජීවාත්ම දරුවන්ය, එබැවින් ඔවුන් සහෝදරයන්ය. ඔබගේ උරුමය හිමි කරගැනීමට, ඔබ අනිවාර්යෙන්ම සහෝදරයන් විය යුතුයි. ජීවාත්මයක්, පරමාත්ම පියාගේ පුතෙකි. ඔබ, ඔබගේ පියාගෙන් උරුමය හිමි කරගනී, එබැවින් ඔබට නිසැකයෙන්ම පිරිමින් යැයි කියයි. සියලුම ජීවාත්මයන්ට, පියාගෙන් උරුමයක් හිමි කරගැනීමට අයිතියක් තිබේ. ඒ සඳහා ඔබ පරම පියා සිහි කළ යුතුයි. තමන් ජීවාත්ම බව සලකන්න. අපි සියල්ලන්ම සහෝදරයන්ය. ජීවාත්මයක් ජීවාත්මයකි. ජීවාත්ම කිසි විටෙක වෙනස් නොවන නමුත්, ඔවුන් විටෙක පිරිමි සිරුරක්ද විටෙක ස්ත්‍රී සිරුරක්ද ගනී. මේවා වටහා ගත යුතු බොහෝ සිත්ගන්නා සුළු කරුණුයි. වෙනත් කිසිවෙකුට ඒවා කිව නොහැක. අන් අයට මෙය ඇසිය හැක්කේ පියාගෙන් හෝ ඔබගෙන් පමණයි. පරම පියා කතා කරන්නේ ඔය දරුවන්ට පමණයි. මුල් දිනවල ඔහු සෑම කෙනෙක්වම හමුවී කතා කළේය. ක්‍රම-ක්‍රමයෙන් ඔහු කිසි කෙනෙකුට කතා නොකරන කාලයක් පැමිණෙයි. 'පුතා, පියාව පෙන්වයි' යනු කියමනකි. ඔය දරුවන් අන් අයට ඉගැන්විය යුතුයි. ඔය දරුවන් බොහෝ දෙනෙකුට සේවය කර, ඔවුන්ව මෙහි කැඳවාගෙන එයි. ඔබ බොහෝ දෙනෙක්ව ඔබට සමාන කර, මෙහි කැඳවාගෙන පැමිණෙන බව, බාබාට වැටහෙයි. මෙම කෙනා මහා රජෙක් වෙයි මෙම කෙනා සුළු රජෙක් වෙයි. ඔබ, සෑම කෙනෙක්වම රාවණගේ යදම් වලින් මුදවා, ඔබගේ දූත මෙහෙයට රැගෙන එන, ආධ්‍යාත්මික සේනාවයි. ඔබ කරන සේවයට අනුව, ඔබට ඵලය ලැබෙයි. වැඩියෙන් භක්තියේ යෙදී ඇති අය, දක්ෂ වී, ඔවුන්ගේ උරුමය හිමි කරගනි. මෙය ඉගෙනුමකි. ඔබ හොඳින් ඉගෙන නොගන්නේ නම්, ඔබ අසමත් වෙයි. මෙම ඉගෙනුම ඉතාමත්ම පහසුයි. එය වටහා ගැනීමට මෙන්ම විස්තර කර දීමටද පහසුයි. කිසිම අපහසුතාවයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. කෙසේවෙතත්, රාජධානියක් ස්ථාපිත කරන බැවින්, සියලුම මාදිලියේ අය අවශ්‍ය වෙයි. ඔබ මෙහිදී උසස් තත්ත්වයක් හිමි කරගැනීමට උත්සාහ දැරිය යුතුයි. ඔබ මරණීය දේශයෙන්, අමරණීය දේශයට මාරුකර යැවිය යුතුයි. ඔබ වැඩියෙන් ඉගෙන ගන්නා ප්‍රමාණයට අනුව, අමරණීය දේශයේ ඔබට වඩා උසස් තත්ත්වයක් හිමි වනු ඇත. ඔහු සියලු දෙනාටම වඩා ආදරණීය බැවින්, ඔබ පරමාත්ම පියාට බොහෝ සේ ආදරය කළ යුතුයි. සෙනෙහසේ මහා

සාගරය ඔහුයි. ඔබ සියලු දෙනාටම එක හා සමාන ආදරයක් තිබිය නොහැක. සමහරු ඔහුව සිහිපත් කරන අතර සමහරුන් ඔහුව කොහෙත්ම සිහි නොකරයි! සමහරුන්ට වෙනත් අයට විස්තර කර දීමේ කුල්මත්භාවය ඇත. මෙය විශාල පෙළඹවීමකි. මෙය විශ්ව විද්‍යාලයක් බව ඔබට ඕනෑම කෙනෙකුට කිව හැක. මෙය ආධ්‍යාත්මික ඉගෙනුමයි. වෙනත් කිසිම පාසැලක මෙවන් පිංතූර නොපෙන්වයි. ඒවා දෙස බැලීමෙන් පමණක් සෑම දෙයක්ම මිනිසුන්ට වටහාගැනීමට හැකි වන අන්දමේ පිංතූර දිනෙන් දින දිගටම මතු වෙයි. ඉනිමගේ පිංතූරය ඉතා හොඳයි. කෙසේවෙතත්, දේවතා වංශයට අයත් නැති අය කිසි දෙයක් වටහා නොගනී. මෙම වංශයට අයත් අයට, ඊතලය වැදෙයි. අපගේ දේවතා ධර්මයේ පත්‍ර වන අය, පැමිණෙයි. ඔවුන් විශාල උනන්දුවකින් සවන් දෙන බව ඔබට හැඟෙයි. සමහරු නිකම්ම පැමිණ ආපසු යයි. දිනෙන් දින, බාබා ඔය දරුවන්ට අළුත් දේවල් විස්තර කරයි. සේවය කිරීමට ඔබ තුළ විශාල උනන්දුවක් තිබිය යුතුයි. සේවය කිරීමේ කාර්යබහුලව සිටින අය, හදවත් සිහසුනේ අසුන් ගෙන සිටින අතර, එම සිහසුනේද අසුන් ගනී. ඔබ තව දියුණුවත්ම ඔබට සෑම දේකම දර්ශන පෙනෙයි ඔබ එම ප්‍රීතියේ රැඳී සිටියි. ලෝකයේ බොහෝ දුක් අඳෝනා තිබෙයි. ලේ ගංඟාවන් ද ගලයි. සේවය කරන එඩිතර අය, කිසි විටෙක සාගින්නේ මිය නොයයි. කෙසේවෙතත්, ඔබ මෙහි චාම් බවින් සිටිය යුතුයි. ඔබට එහිදී සතුට ලැබෙයි. කුමාරි කෙනෙක්ව චාම්ව තබන අතර, පසුව ඇයගේ විවාහක නැන්දා-මාමාලා වෙතට ගිය විට, ඇයට අවශ්‍ය සෑම දෙයක්ම පැළඳිය හැක. ඔබද ඔබගේ නැන්දා-මාමලාගේ නිවසට යන බැවින්, ඔබට එම කුල්මත්භාවය තිබිය යුතුයි. එය සතුටේ දේශයයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මාලාවේ ඇමිණීම සඳහා, ජීවාත්ම අවධානයට පත් වී, විශාල තීව්‍රතාවයකින් සිහිපත් කිරීමේ වන්දනා ගමනේ රැඳී සිටින්න. පරමාත්ම පියාගේ උපදෙස් අනුගමනය කර, පිවිතුරු වන්න.
2. ඔවුන්ට පරම පියාගේ පණිවුඩය ලබා දීමෙන්, බොහෝ දෙනෙක්ව ඔබට සමාන කිරීම සඳහා සේවය කරන්න. ඔබ මෙහි ජීවත් විය යුත්තේ චාම්වයි. දුක් අඳෝනාවන්ගේ අවසන් ජවනිකා දැක ගැනීමට හැකි වීම සඳහා, ඔබ මහා වීරයෙක් (එඩිතර සටන්කාමියෙක්) විය යුතුයි.

**වරදානය:** ඔබ සැබෑ භාරකරුවෙකු වී, ඕනෑම බන්ධන කූඩුවක් අවසන් කිරීමෙන් ජීවිතයේ විමුක්ති (ජීවනමුක්ති) ස්ථිතියක් අත්විඳිත්වා.

ශරීර හෝ සබඳතා වල ඕනෑම බන්ධනයක් කූඩුවකි. ඔබට ඔබේ පවුලේ යුතුකම් බන්ධනයෙන් තොරව වගකීමේ නාමයෙන් ඉටු කිරීමට සිදුවන විට, ඔබ බන්ධනයෙන් නිදහස් යැයි කියනු ලැබේ. භාරකරුවන් ලෙස ගමන් කරන අය බන්ධනයෙන් නිදහස් වෙති. "මගේ" යන දැනීමක් තිබේ නම්, එය කූඩුවක සිටීම හා සමානයි. කූඩුවක සිටින ගිරවුන් මෙන් සිටීමෙන් ඔබ දැන් දේවදූතයන් බවට පත්ව ඇත. එබැවින්, ඔබේ මනසෙහි සුළු බන්ධනයක්වත්, කිසිදු බන්ධනයක්වත් නොතිබිය යුතුය. "මට කුමක් කළ හැකිද? මට මෙය කළ හැක්කේ කෙසේද? මට අවශ්‍යයි, නමුත් එය සිදු නොවේ." මේ සියලු සිතුවිලි ඔබේ මනසෙහි බන්ධන වේ. ඔබ ජීව මරණයක් ලද පසු, ඔබේ සියලු බන්ධන අවසන් වන අතර ඔබ ජීවිතයේ නිදහස් වීමේ ස්ථිතිය අත්විඳීම දිගටම කරගෙන යා යුතුය.

**පාඨය:** ඔබ ඔබේ සිතුවිලි ඉතිරි කරන විට, ඔබේ කාලය සහ වචන ස්වයංක්‍රීයව ඉතිරි වේ.

***** ඔම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ වීමට සහ කර්මාතීත් වීමට ගැඹුරු සැලකිල්ලක් දක්වන්න.**

කර්මාතීත් වීම යනු කර්මයේ කිසිදු බන්ධනයකින් නොබැඳිව සිටීම සහ එය ස්පර්ශ නොකිරීමයි. මේ පිළිබඳ ඔබේ අත්දැකීම් වැඩි කරන්න. කිසිදු ක්‍රියාවක් ඔබව ස්පර්ශ නොකළ යුතුය, එබැවින් ඔබ කළ ඕනෑම කාර්යයක ප්‍රතිඵලයෙන් පවා ඔබව ස්පර්ශ කිරීමට ඉඩ නොදෙන්න. සම්පූර්ණ නොබැඳි වීම අත්විඳීම දිගටම

කරගෙන යන්න. එය වෙනත් කෙනෙකු ඔබට එය කිරීමට පෙළඹවූ අතර ඔබ එය කළාක් මෙනි. ඔබ යම් දෙයකට උපකරණයක් වූ විට පවා නොබැඳිව සිටීම අත්විඳින්න. කුමක් සිදු වුවද, එයට සම්පූර්ණ නැවතුමක් තබා නොබැඳිව සිටින්න.